සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

08 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය : පැය දෙකයි

නම / විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) දේශාංශ $0^0$ හඳුන්වනු ලබන්නේ,
(සමකය / ග්‍රිනිච් මධ්‍ය රේඛාව / උත්තර ධ්‍රැවය)

(02) සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානත ම මූලය වන්නේ,
(සෙනසුරු / බුධ / සූර්යයා)

(03) සෞරග්‍රහ මණ්ඩලයේ බාහිර ග්‍රහලෝකයකි,
(බුධ / බ්‍රහස්පති / සිකුරු)

(04) බංග්ලාදේශයේ අගනගරය වන්නේ,
(ඩකා / තිම්පු / ඉස්ලාමාබාද්)

(05) ඩෙකෑන් සානුව පිහිටා ඇති රට වන්නේ,
(පාකිස්තානය / ඉන්දියාව / නේපාලය)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා ඒවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(06) උතුරු අර්ධගෝලයට ග්‍රීෂ්ම ඍතුව බලපවත්වන්නේ ජූනි මාසයේ ය. (..........)

(07) මාර්තු මස 21 සහ සැප්තැම්බර් මස 23 යන දිනයන් හී දී සූර්යයා සමකයට මුදුන් වේ. (..........)

(08) පෘථිවි පරිභ්‍රමණයට පැය 23 යි මිනිත්තු 56 ක් ගත වේ. (..........)

(09) සම්මත වේලා කලාප 24කට පෘථිවිය බෙදා ඇත. (..........)

(10) සිකුරු ග්‍රහයා නැගෙනහිර සිට බටහිරට භ්‍රමණය වේ. (..........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(11) සෞරග්‍රහ මණ්ඩලයේ දෙවනුවට විශාලතම ග්‍රහලෝකය ................................................................ වේ.

(12) ග්‍රහලෝකයක් වටා කක්ෂගත ව පරිභ්‍රමණය වන කුඩා පරිවාර ග්‍රහලෝක .............................. ලෙස හැඳින්වේ.

(13) ගොඩබිම සහ වායුගෝලය අතර ජලය චක්‍රීය ලෙස හුවමාරුව .............................................. ලෙස හැඳින්වේ.

(14) දකුණු ආසියාවේ දෙවනුවට විශාලතම රට ........................................................ යි.

(15) ග්‍රිනිච් නගරයට සඳුදා දින මධ්‍යාහ්න 12 යැයි සිතන්න. එම අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ වේලාව ........................................................ වේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල 'අ' කොටසේ දක්වා ඇති දකුණු ආසියාවේ විවිධ භූ දර්ශනයන්ට අදාළ ලක්ෂණය 'ආ' කොටසෙන් තෝරා, එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය 'අ' කොටස ඉදිරියෙන් ඇති වරහන තුළ ලියා දක්වන්න.**

| 'අ' කොටස | | 'ආ' කොටස |
|---|---|---|
| (16) වැව කේන්ද්‍රව ජනාවාස විහිදී ඇත. | (...........) | A - කාන්තාර භූ දර්ශනය |
| (17) අඩු ආදායම් ජනාවාස බහුල ය. | (...........) | B - වෙරළබඩ භූ දර්ශනය |
| (18) තැනින් තැන ක්ෂේම භූමි පවතී. | (...........) | C - කඳුකර භූ දර්ශනය |
| (19) නොදියුණු ගෝත්‍රික ජනයා වාසය කරයි. | (...........) | D - කාර්මික හා නාගරික භූ දර්ශනය |
| (20) ධීවර කර්මාන්තය ප්‍රමුඛ වේ. | (...........) | E - ග්‍රාමීය භූ දර්ශනය |
| | | F - තිමිත භූ දර්ශනය |

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගන්නා අනෙකුත් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.**

(01) සපයා ඇති දකුණු ආසියානු සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




1. 'A' අක්ෂරයෙන් දක්වා ඇති බොක්ක නම් කරන්න.
2. 'B' අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?
3. ලොව දෙවනුවට විශාලම සිනමා කර්මාන්තය පිහිටි ප්‍රදේශයට අදාළ අක්ෂරය ලියන්න.
4. ථාර් කාන්තාරය දැක්වෙන අක්ෂරය ලියන්න.
5. 'F' අක්ෂරයෙන් දැක්වෙන සානු ප්‍රදේශය නම් කරන්න.
6. අරාබි මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද?
7. 'G' අක්ෂරයෙන් දැක්වෙන කඳුවැටිය කුමක් ද?
8. 'H' අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?
9. 'I' අක්ෂරයෙන් දැක්වෙන දූපත් සමූහය කුමක් ද?
10. 'J' අක්ෂරයෙන් දැක්වෙන නගරය කුමක් ද? (ල. 2 x 10 = 20)

(02) 1. සූර්යයා සතු විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

2. පෘථිවියෙහි ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

3. අ) සෞරග්‍රහ මණ්ඩලය හා බැඳී පවතින විශ්වාස දෙකක් ලියා දක්වන්න. (ල. 02)

ආ) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ නව සොයාගැනීම් දෙකක් ලියන්න. (ල. 03)

(03) 1. අක්ෂාංශ යනු මොනවා ද? (ල. 02)

2. පෘථිවිය මත පවතින ප්‍රධාන සෘතු තුනක් ලියන්න. (ල. 03)

3. අ) වසන්ත සෘතුවෙහි ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

ආ) පෘථිවි පරිභ්‍රමණයෙහි ප්‍රතිඵල දෙකක් ලියා දක්වන්න. (ල. 03)

(04) 1. පෘථිවි වායුගෝලයෙහි පවතින ප්‍රධාන වායූන් දෙකක් ලියන්න. (ල. 02)

2. පෘථිවිය මත ජලය පවතින ප්‍රධාන ස්වරූප තුන ලියා දක්වන්න. (ල. 03)

3. අ) ජලයෙහි ප්‍රයෝජන තුනක් ලියා දක්වන්න. (ල. 03)

ආ) ජල දූෂණයට ඉවහල්වන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 02)

(05) 1. දකුණු ආසියාවේ කඳුකර භූ දර්ශකයෙහි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

2. හිමාලය කඳුකර ප්‍රදේශයේ ජීවත්වන ගෝත්‍රික කණ්ඩායම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

3. අ) දකුණු ආසියානු කඳුකර භූ දර්ශකයෙහි පවතින විනෝද ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 02)

ආ) මෙම කඳුකර ප්‍රදේශවල දැකිය හැකි රැකියා තුනක් නම් කරන්න. (ල. 03)

(06) 1. දකුණු ආසියානු වෙරළබඩ භූ දර්ශනය තුළ දැකිය හැකි විශේෂ භෞතික ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 02)

2. ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට බලපෑ වෙරළ ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල. 03)

3. අ) ශ්‍රී ලංකාවෙහි වෙරළ තීරය ආශ්‍රිතව පවතින රැකියා වර්ග දෙකක් ලියා දක්වන්න. (ල. 02)

ආ) ශ්‍රී ලංකාවේ වෙරළ තීරයන් ආශ්‍රිතව පවතින නගර තුනක් නම් කරන්න. (ල. 03)